# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2008 අංක 29 දරන මල්වතු මහා විහාරීය තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ සුමංගල මානව සහයෝගිතා පදනම (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 2008 අගෝස්තු මස 05 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2008 අගෝස්තු මස 08 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ : රු. 7.00 යි. තැපැල් ගාස්තුව : රු. 5.00 යි.

# 2008 අංක 29 දරන මල්වතු මහා විහාරීය තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ සුමංගල මානව සහයෝගිතා පදනම (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 2008 අගෝස්තු මස 05 වන දින]

එල්. ඩී. — ඕ.අයි.එන්.සී. 16/ 2005

## මල්වතු මහා විහාරීය තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ සුමංගල මානව සහයෝගිතා පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

"මල්වතු මහා විහාරීය තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ සුමංගල මානව සහයෝගිතා පදනම" යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන පදනමක් එහි සාමාජිකයන් එකඟවන ලද රීතිවලට අනුකූලව එකී පදනමට සම්බන්ධ සියලු පරමාර්ථ හා කාරණා ඵලදායී ලෙස කරගෙන යාමේ හා ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා මෙතෙක් කල් මහනුවර නගරයේ පිහිටුවා තිබූ හෙයින් ද : පූර්විකාව.

එකී පදනම පිහිටුවන ලද්දේ යම් පරමාර්ථ හා කාරණා සඳහා ද, ඒ පරමාර්ථ හා කාරණා එකී පදනම විසින් මෙතෙක් කල් සාර්ථකව ක්‍රියාත්මක කර හා ඉටු කර ඇති හෙයින් ද එකී පදනම සංස්ථාගත කරන ලෙස ඉල්ලුම් කර ඇති හෙයින් ද, එකී ඉල්ලීමට ඉඩදීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 2008 අංක 29 දරන මල්වතු මහා විහාරීය තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ සුමංගල මානව සහයෝගිතා පදනම (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දිනයේ සිට හා ඉන් පසු (මෙහි මින් මතු "පදනම" යනුවෙන් සඳහන් කරනු ලබන ) මල්වතු මහා විහාරීය තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ සුමංගල මානව සහයෝගිතා පදනමෙහි දැනට සාමාජිකයන්ව සිටින සියලු තැනැත්තන් සහ මෙයින් පිහිටුවනු ලබන සංස්ථාවට සාමාජිකයන් වශයෙන් මින් මතු බඳවා ගනු ලබන තැනැත්තන් (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "මල්වතු මහා විහාරීය තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ සුමංගල මානව සහයෝගිතා පදනම" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, ඒ නාමයෙන් ඒ සංස්ථාව විසින්ද එයට විරුද්ධව ද සියලු අධිකරණවලදී නඩු පවරනු ලැබිය හැකිය. තව ද පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද එය පාවිච්චි කිරීමේ ද ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය හා අධිකාරය එම සංස්ථාවට ඇත්තේ ය. මල්වතු මහා විහාරීය තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ සුමංගල මානව සහයෝගිතා පදනම සංස්ථාගත කිරීම.

2-PL 002432 - 2,800 (2007/09)

සංස්ථාවේ පොදු පරමාර්ථ.

3. සංස්ථාව පිහිටුවනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද, ඒ පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :—

(අ) බුද්ධාගම හා සම්බන්ධ විෂයයන් අධ්‍යයනයට හා පර්යේෂණ කිරීමට අනුග්‍රහය දැක්වීම හා එම කටයුතු ප්‍රවර්ධනය කිරීම ;

(ආ) බෞද්ධ ධර්මය අදහන තැනැත්තන්ට ඉගැන්වීම පිණිස ද, බෞද්ධ ධර්මය ඉගැන්වීම පිණිස ද අධ්‍යාපනික ආයතන පිහිටුවීම සහ පවත්වාගෙන යාම සහ බුද්ධ ධර්මය හා සාරධර්ම පිළිබඳව බෞද්ධයන් දැනුවත් කිරීම, ඉගැන්වීම සහ බුද්ධ ධර්මය හා බෞද්ධ සාරධර්මවලට අනුකූලව ඔවුන්ගේ ජීවිත ගෙනයාමට උනන්දු කරවීම ;

(ඇ) බෞද්ධ උත්සව, චාරිත්‍රවිධි, වත්පිළිවෙත්, ව්‍යවහාරයන් හා සම්ප්‍රදායයන් වැඩිදියුණු කිරීම, පෝෂණය කිරීම හා සංරක්ෂණය කිරීම සහ විහාර, ආශ්‍රම, පිළිම, භාවනා මධ්‍යස්ථාන සහ අනෙකුත් සිද්ධස්ථාන පිහිටුවීම සහ පවත්වාගෙන යාම ;

(ඈ) ශිෂ්‍යත්ව, අධි ශිෂ්‍යත්ව, ත්‍යාග, සහතික හා වෙනත් ප්‍රදානයන් ලැබීමට අවශ්‍යතා සම්පූර්ණ කරන බෞද්ධයන්ට එකී ප්‍රදානයන් කිරීම සහ ඔවුන් සඳහා අධ්‍යාපන පහසුකම් හා සේවා සැපයීම ;

(ඉ) භික්ෂූන් වහන්සේලා පුහුණු කිරීම වැඩිදියුණු කිරීම ;

(ඊ) සාමය ප්‍රවර්ධනය කිරීම හා සමාජයේ ආගමික සමාදානය පෝෂණය කිරීම ;

(උ) බෞද්ධ ළමයින් සඳහා ද, අනාථ, ආබාධිත, දුබල, මහලු හා අවතැන් වූ බෞද්ධ පුද්ගලයන් සඳහා ද සමාජ හා සුභසාධන පහසුකම් සැපයීම සහ සුභසාධනය, පුහුණුව හා පුනරුත්ථාපනය සඳහා මධ්‍යස්ථාන හා ආයතන ඇති කිරීම හා පවත්වාගෙන යාම ;

(ඌ) පුස්තකාල, තොරතුරු හා පර්යේෂණ මධ්‍යස්ථාන පිහිටුවීම සහ පවත්වාගෙන යාම ;

(එ) බෞද්ධ තරුණ තරුණියන්ට තාක්ෂණ දැනුම ලබාදීම අරමුණු කොට ගෙන යම් කර්මාන්තයක හෝ වෘත්තියක සහභාගී කරවීම සහ පුහුණු වැඩ සටහන් පැවැත්වීම ;

(ඒ) සංස්ථාවේ පරමාර්ථ වැඩිදියුණු කිරීමෙහි ලා ප්‍රදර්ශන, දේශන, සම්මන්ත්‍රණ, වැඩමුළු, පන්ති, විවාද, සම්මේලන හෝ වෙනත් කටයුතු පැවැත්වීම ; සහ

(ඔ) සංස්ථාවේ පරමාර්ථ හා සමාන පරමාර්ථ ඇති වෙනත් සංගම්, සංවිධාන හෝ සමිති සමග සහයෝගයෙන් ක්‍රියා කිරීම.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

4. (1) සංස්ථාවේ කටයුතු කළමනාකරණය, පාලනය හා පරිපාලනය කිරීම 5 වන වගන්තිය යටතේ සාදන ලද රීතිවලට අනුකූලව සාමාජිකයන් අතරින් තෝරා පත්කර ගනු ලබන නිලධරයන් හා වෙනත් යම් තැනැත්තන්ගෙන් සමන්විත (මෙහි මින් මතු "සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) පාලක සභාවක් විසින් මේ පනතේ වෙනත් විධිවිධානවලට සහ මේ පනතේ 5 වන වගන්තිය යටතේ සාදනු ලබන රීතිවලට යටත්ව කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ කුමක් සඳහන් වුව ද, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ දී ධුර දැරූ පදනමේ නිර්මාතෘ සභාපතිවරයා කලින් ධුරය හිස් කළහොත් මිස, සංස්ථාවේ පළමු සභාපතිවරයා විය යුතු ය.

(3) සංස්ථාවේ පළමු සභාපතිවරයාගේ අභාවයෙන් පසුව මල්වතු පාර්ශ්වයේ මහානායක ධුරයට අනුප්‍රාප්ත වන මහානායක හිමියන් සංස්ථාවේ ඊළඟ සභාපතිවරයා බවට පත්විය යුතු අතර, එම කාර්ය පටිපාටිය එයින් පසුව ඉදිරියට ඒ ආකාරයෙන් ම අඛණ්ඩව පවත්වාගෙන යා යුතු ය.

(4) සංස්ථාවේ පළමු සභාව මේ පනත ආරම්භ වන දින පදනමේ පාලක සභාවේ ධුර දරන්නා වූ සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය.

සංස්ථාවේ රීති.

5. (1) පහත දැක්වෙන කරුණු සඳහා මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති සංස්ථාවේ යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන් කලින් කල සංස්ථාව විසින් සෑදීම නීත්‍යානුකූල වන්නේය :—

(අ) සාමාජිකත්වය වර්ග කිරීම සහ සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම හෝ ඔවුන් නෙරපීම ;

(ආ) සංස්ථාවේ නිලධරයන් තෝරාපත්කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම, ඔවුන් ධූරය හිස් කිරීම හෝ ඔවුන් ධූරයෙන් නෙරපීම සහ ඔවුන්ගේ බලතල, කාර්ය හා කර්තව්‍ය ;

(ඇ) සභාවේ සාමාජිකයන් තෝරා පත්කර ගැනීම සහ සභාවේ බලතල, කාර්ය සහ කර්තව්‍ය සහ සභාවේ සාමාජිකයන්ගේ ධූර කාලය ;

(ඈ) සභාවේ රැස්වීම් කැඳවීම, පැවැත්වීම සහ ඒ රැස්වීම්වල දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය, ඒ රැස්වීම් පවත්වන දිනය, ස්ථානය, රැස්වීම් පිළිබඳ දැන්වීම්, න්‍යාය පත්‍ර හා රැස්වීම්වල ගණපූරණය හා රැස්වීම්වල දී සාකච්ඡාවට භාජනය කළ යුතු කරුණු ;

(ඉ) සංස්ථාවේ දේපළ පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම ; සහ

(ඊ) සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම.

(2) සංස්ථාව විසින් සාදනු ලැබූ යම් රීතියක්, (1) වන උපවගන්තිය යටතේ ඒ රීතිය සාදනු ලැබූ ආකාරයෙන් ම සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ එය පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සාමාජිකයන් මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වූ විට සංස්ථාව විසින් කලින් කල සාදනු ලබන රීතිවලට යටත්විය යුතු ය.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

6. බැංකු ගිණුම් ආරම්භ කිරීම, පවත්වාගෙන යාම සහ වැසීම, ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීම හෝ ලබාගැනීම, ප්‍රදාන සහ පරිත්‍යාග භාරගැනීම, එකතු කිරීම, ස්වකීය අරමුදල් ආයෝජනය කිරීම, සංස්ථාවේ පරමාර්ථ ඉටුකර ගෙන යාම සඳහා අවශ්‍ය නිලධරයන් හා සේවකයන් සේවයට බඳවා ගැනීම, සේවයේ යෙදවීම හා සේවයෙන් පහ කිරීම ඇතුළුව සංස්ථාවේ පරමාර්ථ සියල්ල ම හෝ ඉන් කිසිවක් ඉෂ්ට කිරීම හෝ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය සියලු ක්‍රියා. කාරණා සහ දේ මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, සිදු කිරීමේ, ඉටු කිරීමේ සහ ක්‍රියාත්මක කිරීමේ බලය සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ අරමුදල

7. (1) සංස්ථාවට එහි ම අරමුදලක් තිබිය යුතු ය.

(2) සංස්ථාව සඳහා සහ වෙනුවෙන් භාරගනු ලබන ත්‍යාග, රික්තපවරණ, පරිත්‍යාග, සම්මාදම් මුදල්, දායක මුදල්, ගාස්තු හෝ ප්‍රදාන වශයෙන් ලැබෙන සියලු මුදල් සභාව විසින් තීරණය කරනු ලබන පරිදි එක් බැංකුවක හෝ බැංකු වැඩි ගණනක සංස්ථාවේ බැරට තැන්පත් කරනු ලැබිය යුතු ය.

(3) මේ පනත යටතේ ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, ඉටු කිරීමේ දී සහ කිරීමේ දී සංස්ථාව විසින් දරන ලද වියදම් කිසිවක් පියවීමට අවශ්‍ය සියලු මුදල් අරමුදලින් ගෙවනු ලැබිය යුතුය.

(4) කවර හෝ ආකාරයෙන් උපචිත වූව ද සංස්ථාවේ ආදායම හා දේපළ හුදෙක් ම මෙහි දක්වා ඇති පරිදි වූ සංස්ථාවේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීම සඳහා ම යොදා ගත යුතු අතර, ඉන් කිසිම කොටසක් සංස්ථාවේ යම් සාමාජිකයකුට ලාභාංශ, ප්‍රසාද මුදල් හෝ වෙනත් ආකාරයකින් කෙලින් ම හෝ අන්‍යාකාරයෙන් ගෙවීම හෝ පැවරීම කරනු නොලැබිය යුතු ය

පදනම විසින් ගෙවිය යුතු සහ පදනමට අයවිය යුතු ණය

8. මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පැවැති පදනමේ සියලු ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවා නිදහස් කළ යුතු අතර, එදිනට පදනමට අයවිය යුතු හෝ ගෙවිය යුතු සියලුම ණය, දායක මුදල් සහ සම්මාදම් මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාව විසින් චංචල හෝ නිශ්චල දේපළ දැරිය හැකි බව.

9. යම් මිලට ගැනීමක්, තෑග්ගක්, තෙස්තමේන්තු නියෝගයක් ප්‍රකාර හෝ අන්‍යාකාරයකින් හෝ සංස්ථාව සතුවන යම් චංචල හෝ නිශ්චල දේපළක් අත්කර ගැනීමට හා දැරීමට නීත්‍යානුකූලව සංස්ථාවට හැකියාව හා බලය ඇති අතර, එම දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බද්දට දීමේ, හුවමාරු කිරීමේ හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය ඇතිව මේ පනතේ කාර්යය සඳහා සංස්ථාවේ රීතිවලට යටත් ව, එකී සියලු දේපළ සංස්ථාව විසින් දැරිය යුතු ය.

විගණනය සහ ගිණුම්.

10. (1) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතුය.

(2) සංස්ථාව විසින් එහි ආදායම් හා වියදම්, වත්කම් හා බැරකම් සහ සංස්ථාවේ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් තබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(3) සංස්ථාවේ ගිණුම් සුදුසුකම් ලත් විගණකවරයකු විසින් විගණනය කරනු ලැබිය යුතු ය.

මේ වගන්තියේ "සුදුසුකම් ලත් විගණකවරයා" යන්නෙන්-

(i) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක් ; හෝ

(ii) යම් ගණකාධිකාරී සමාගමක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකුව සිටින්නේ ද එමෙන්ම ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියේ යෙදීම සඳහා එකී ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නේ ද, එවැනි වරලත් ගණකාධිකාරී සමාගමක්,

අදහස් වේ.

සංස්ථාවේ මුද්‍රාව තැබිය යුතු ආකාරය.

**11.** සංස්ථාවේ රීතිවලින් විධිවිධාන සලසනු ලැබිය හැකි පරිදි වූ නිලධරයන් සංඛ්‍යාවක් ඉදිරිපිටදී මිස සංස්ථාවේ මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට තබනු නොලැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් එම නිලධරයන් එකී සාධන පත්‍රයෙහි තම තම අත්සන් තැබිය යුතු වුව ද ඒ අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමකට පරිබාහිරව විය යුතු ය.

විසුරුවා හැරීමෙන් පසු ඉතිරි වන දේපළ.

**12.** සංස්ථාව විසුරුවා හැරීමේ දී එහි සියලු ණය සහ බැරකම් පියවීමෙන් පසු කවර වුව ද දේපළක් ඉතිරි වුවහොත්, ඒ දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදනු නොලැබිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද ස්වකීය ආදායම හෝ දේපළ කිසිවක් තම සාමාජිකයන් අතර බෙදාදීම එහි රීති මගින් තහනම් කොට ඇත්තා වූ ද, වෙනත් යම් ආයතනයකට හෝ ආයතනවලට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය. ඒ ආයතනය හෝ ආයතන කවරේදැයි සංස්ථාවේ සාමාජිකයන් විසින් සංස්ථාව විසුරුවා හරිනු ලබන අවස්ථාවේ දී හෝ ඊට පෙරාතුව තීරණය කරනු ලැබිය යුතු ය.

**13**. ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

ජනරජයේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**14**. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 යි. (විදේශීය) රු. 1.160 යි. අංක 163. කිරුළපන මාවත, පොල්හේන්ගොඩ කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.